2024-08.

# මිගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2024
# සිංහල භාෂාව හා සාහිත්‍යය

Learning Resource Center
R
De Mazenod College
Kandana

නම / විභාග අංකය : ..............................................................................................

| 08 ශ්‍රේණිය | I සහ II පත්‍රය | කාලය : පැය දෙක යි. |
|---|---|---|

- සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම කොටස සඳහා **ලකුණු 40ක්** ලැබේ.
- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) වරණවලින් **නිවැරදි** උත්තරය තෝරා යටින් ඉරක් අඳින්න.

- **අංක 01 සහ 02 ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳි කොටසේ අදහස ප්‍රකාශ වන පිළිතුර තෝරන්න.**

(01) වෙළෙඳාමක් කරන විට කාගේවත් <u>බඩට ගහන්න</u> එපා යැයි අබිලිනු උන්නැහේ නිතර කියයි.

(1) හිංසා පීඩා කරන්න (2) ආදායම අහිමි කරන්න
(3) ලාභය වැඩි කරන්න (3) වංචා සිදු කරන්න

(02) වාහනයේ <u>ලැල්ලට පාගා</u> ගිය ඔහුට අවසානයේ සිදු වූයේ රෝහලේ නැවතීමට ය.

(1) නොසැලකිල්ලෙන් (2) අවසියෙන්
(3) අධික වේගයෙන් (4) බීමතින්

(03) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) වාර්තාව, දෘෂ්ටිය, කොට්ඨාසය, විශිෂ්ට (2) කනිෂ්ඨ, උච්චාරණය, නිශ්ශබ්ද, දර්ශණය
(3) කැළණිය, ජ්‍යෙෂ්ඨ, වර්ධනය, ආකාශය (4) සිසු කැළ, තුරු පෙළ, පුෂ්පය, වීරෝදාර

(04) අ'කාරාදි පිළිවෙළට නිවැරදිව පෙළ ගස්වා ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(1) යශෝරාවය, නැදැයෝ, නිරානන්දය, කඩුල්ල (2) අයිරාංගනී, ලීලා, සෝමා, ගීතා
(3) පබාවතී, රත්තරන්, වලහැඩියා, මැනේජර් (4) මනමේ, මහාසාර, ලෝමහංස, සිංහබාහු

(05) මහාප්‍රාණ අක්ෂරයක් ඇතුළත් **නො වන** පිළිතුර වන්නේ,

(1) ගිජ්ඣකූට (2) සිංහාසනාරූඪ (3) ප්‍රඥාව (4) ලාංඡනය

(06)

| (අ) | (ආ) |
|---|---|
| A - එක ම කාලයට අයත් | E - අත්තනෝමතික |
| B - උඩඟුබව නොමැති | F - සමකාලීන |
| C - තම මතයට අනුව ක්‍රියා කරන | G - නිහතමානී |

ඉහත දැක්වෙන (අ) සහ (ආ) කොටස් එකිනෙක ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද ?

(1) AG, BE, CF (2) AF, BG, CE
(3) AE, BG, CF (4) AF, BE, CG

(07) නාම විශේෂණයක් සහ ක්‍රියා විශේෂණයක් ඇතුළත් වී ඇති වාක්‍යය තෝරා යටින් ඉරක් අඳින්න.

(1) අලුත් අවුරුද්ද දිනයේ දී පොඩිත්තෝ සතුටින් ඉපිලෙති.
(2) තාත්තා රතිඤ්ඤා පෙට්ටියක් මට තෑගි කළේ ය.
(3) අපි නෑදෑ වැඩිහිටියන්ට බුලත් දී වැන්දෙමු.
(4) ලොකු නැන්දා අපට පැණි කැවුම් සාදා දුන්නා ය.

(08) මුලින් දී ඇති පදයට සමානාර්ථ **නොවන** පදයක් ඇතුළත් වී ඇති පිළිතුර තෝරන්න.

(1) චන්ද්‍රයා - නිශාකර, දියනෙත, සිසි, සොමි (2) පුවත - ආරංචිය, තොරතුර, පවත, ප්‍රවෘත්තිය
(3) චතුර - දක්ෂ, බුහුටි, සමර්ථ, හපන් (4) ඇස - අක්ෂිය, නුවන, නයන, නේත්‍රය

(09) අර්ථයෙන් එකිනෙකට විරුද්ධ පද යුගලය දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ප්‍රශංසාව - කීර්තිය (2) උත්තීර්ණ - සංකීර්ණ
(3) අනුලෝම - ප්‍රතිලෝම (4) කුලීන - කුලභේද

(10) සමානාර්ථ පද දෙකක් එකතු වී සෑදෙන යුගල පද පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ඔප්පු තිරප්පු, දෙස් දෙවොල්, තොවිල් පවිල්, දොර ජනෙල්
(2) බේත් හේත්, හරකා බාන, ළමයි බමයි, තේරුම් බේරුම්
(3) ඇඳ ඇතිරිලි, කොට්ට මෙට්ට, වළං පිඟන්, හට්ටි මුට්ටි
(4) යාන වාහන, අරුම පුදුම, සරු සාර, සැප සනීප

(11) මුලින් දී ඇති බහ්වර්ථ පදයට නොගැළපෙන පදයක් ද ඇතුළත් වී ඇති පිළිතුර තෝරන්න.

(1) කර - බෙල්ල, රශ්මිය, උරය, දැළිපිහිය (2) පිය - ප්‍රිය, පාද, පිහාටු, තාත්තා
(3) දිය - ලෝකය, ලුණුව, ජලය, දෙන්න (4) දළ - ආසන්න, දැඩි, ජටාව, අත

(12) ජාති නාමයක් සහ ක්‍රියා නාමයක් අනුපිළිවෙලින් යෙදී ඇති පිළිතුර තෝරන්න.

(1) මිනිස්, කැවිලි (2) ලියුම්, කටන (3) ඇස්, නැටුම් (4) සිංහ, මහලු

(13) උක්ත නාම පද පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) ඇත්තු, මොනරු, වලසකු, වහල්ලු (2) නළුවෝ, සභාපතිවරු, ක්‍රීඩකයෙක්, සිසුහු
(3) වෙදැදුරු, හෙදියන්, සෙබළුන්, මැණියන් (4) කපුටෙක්, හංසයෝ, කොවුලන්, මුවෝ

(14) විධි ක්‍රියාවක් යෙදී ඇති ප්‍රකාශය කුමක් ද ?

(1) "මේ තියෙන ඇඹුල් අඹ කන්න බැහැ" (2) "බෝතලයට තව වතුර පුරවන්න පුළුවන්"
(3) "එන්න එන්න ම වැහි අඳුර දැඩි වෙයි." (4) "ඔබගේ අදහස් නො සඟවා පවසන්න"

(15) උපමාවක් යෙදී නැති පද පෙළ තෝරා යටින් ඉරක් අඳින්න.

(1) "රුසුයි දිලෙන්නේ ලුණු මෙන් ඇදිලා" (2) "නිදහස් සිරිය ගෙන්වමු සොහොයුරක් මගේ"
(3) "විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල" (4) "මගේ නංගිගෙ පොඩි හිනාව වගේ ය මේ පිච්ච සොකුර"

- ප්‍රශ්න අංක 16 සහ 17 ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර තෝරන්න.

(16) හාන්ස් ක්‍රිස්ටියන් ඇන්ඩර්සන් විසින් රචිත ළමා කතාවක් නො වන්නේ මින් කුමක් ද ?

(1) පුංචි දිය කිඳුරිය (2) අවලස්සණ තාරාවා (3) හිම රජින (4) පන් පසිඳුවන්

(17) • කතරගම පුදබිමෙහි මුළුතැන්ගෙයි සිට දේවාලය කරා ආහාර රැගෙන යන කද
• කතරගම දේවාලයේ තේවා මඩුල්ලට අයත් වන කාන්තාවන් කණ්ඩායම

ඉහත ප්‍රකාශ සඳහා ව්‍යවහාර වන යෙදුම් අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර කුමක් ද ?

(1) දැකුම් කද, දේවදාසීන් (2) මණ්ඩය, ආලත්ති අම්මාවරු
(3) හේම කද, කව්කාර මඩුව (4) මුරුතැන් පූජාව, කිරි අම්මාවරු

- ප්‍රශ්න අංක 18 සිට 20 දක්වා ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.

(18) නාහිමියෝ සාරවත් ධර්ම දේශනාවක් ..................................

(1) පැවැත්වී ය. (2) පැවැත්වූයේ ය. (3) පැවැත්වූහ. (4) පවත්වනු ලැබූහ.

(19) විදුහල්පතිතුමා උසස් පෙළ අංශයට පැමිණි නවක .................................. සාදරයෙන් පිළිගත්තේ ය.

(1) ශිෂ්‍ය නායකයෝ (2) ශිෂ්‍යයින් (3) ශිෂ්‍යයෝ (4) ශිෂ්‍ය නායකයෙක්

(20) නා නා වර්ණ ධජ පෙළ ගුවනෙහි ලෙළ ..................................

(1) දෙයි. (2) දෙති. (3) දෙනු ලබති. (4) දෙන්නී ය.

(ලකුණු 02 x 20 = 40 යි.)

## II - පත්‍රය

• (01) සහ (02) ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. මෙම කොටසට නියමිත ලකුණු ගණන 60කි.

(01) දෙවන වාරයට අදාළව පන්ති කාමරයේ දී ඔබ විසින් සිදු කරන ලද **"කියවීමේ විවිධ ශෛලීන්" නම් වූ ඇගයීම** ඇසුරෙන් අසා ඇති පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) "කියවීම ................................ සම්පූර්ණ කරයි." - හිස්තැනට යෙදිය යුතු වචනය ලියන්න. (ලකුණු 01යි.)

ii) කියවීමේ මූලික ප්‍රභේද **දෙක** නම් කරන්න. (ලකුණු 02යි.)

iii) ශබ්ද නගා කියවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03යි.)

iv) පාසල තුළ 'නිහඬ කියවීම' අනිවාර්ය කොට ඇති ස්ථානය කුමක් ද ? (ලකුණු 02යි.)

v) පැරණි සිංහල බණ කතා පොත් කියවීමේ ශෛලිය නම් කරන්න. (ලකුණු 02යි.)

vi) මෙම ඇගයීම සඳහා යොදා ගත හැකි පහත දැක්වෙන කෘති රචනා කරන ලද කතුවරුන් නම් කරන්න.

• සද්ධර්මරත්නාවලිය - ..................................... • මනමේ නාටකය - ..................................... (ලකුණු 02යි.)

vii) මෙම ඇගයීම සාර්ථකව සිදු කර ගැනීමට ඔබට මග පෙන්වූ **දෙදෙනෙක්** නම් කරන්න. (ලකුණු 02යි.)

viii) ඉහත ඇගයීම සිදු කිරීම මගින් ඔබ ලබා ගත් ප්‍රයෝජන **දෙකක්** ලියන්න. (ලකුණු 02යි.)

(මුළු ලකුණු 16යි.)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන මාතෘකාවලින් **එකක් තෝරා ගෙන වචන 150කට නො අඩු රචනයක්** ලියන්න.

(අ) සුවබර දිවියකට මග කියන ක්‍රීඩාව

(ආ) අභිමානවත් ශ්‍රී ලංකාවක් ගොඩ නංවමු

(ඉ) මං දුටු ඇසළ පෙරහැර

(ඊ) ප්‍රිය වචන කතා කිරීමේ ඇති අගය

(ලකුණු 14යි.)

(03) සාහිත්‍ය මාසය වෙනුවෙන් ඔබේ පාසලේ සිංහල සාහිත්‍ය සංගමය විසින් පැවැත්වීමට බලාපොරොත්තු වන "පොත් ප්‍රදර්ශනය හා සල්පිල" පිළිබඳ සිසු සිසුවියන් දැනුම්වත් කිරීම සඳහා පාසලේ දැන්වීම් පුවරුවල පළ කිරීමට සුදුසු ආකර්ෂණීය බවින් යුතු **දැන්වීම් පත්‍රිකාවක්** සකස් කරන්න. ( දිනය, වේලාව සහ ස්ථානය සුදුසු පරිදි යොදන්න.)

(ලකුණු 10යි.)

නැතහොත්

අංක : 18/2, සිරිබරමැණිකේ මාවත, පැරකුම්පුර පදිංචි ඉලංගකෝන් මුදියන්සේලාගේ සඳුන් රශ්මික විජේසිංහ නමැති ශිෂ්‍යයා 2011.07.19 දින උපත ලද්දෙකි. ඔහු තම පාසලේ මාධ්‍ය ඒකකයට බැඳීමට කැමැත්තෙන් සිටියි. කථික සහ නිවේදක හැකියාවන් ද ඔහුට ඇත. මෙම තොරතුරු ද තවත් සුදුසු තොරතුරු ද ඇතුළත් කොට මාධ්‍ය ඒකකයට බැඳීම සඳහා ඔහු විසින් සකසනු ලබන **අයදුම් පත** නිර්මාණය කරන්න. ( අයි. එම්. එස්. ආර්. විජේසිංහ ඔබ යැයි සිතන්න.)

(ලකුණු 10යි.)

(04) පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

i) දුෂ්කර පාසල් වෙත .................................. යන්ත්‍ර ලබා දීමේ ව්‍යාපෘතියක් ආරම්භ විය. ( පරිසණක / පරිගණක )

ii) සිදු වූ ප්‍රමාද දෝෂ ගැන නිලධාරියා සිය .................................. පළ කළේ ය. ( කනගාටුව / කණගාටුව )

iii) නාමලී .................................. පිබිද පාඩම් වැඩ කටයුතුවල යෙදෙන්නී ය. ( අළුයම / අලුයම )

iv) ශිෂ්‍ය නායක නිල ලාංඡන .................................. උලෙල මේ මස අග දී පැවැත්වේ. ( පැළඳවීමේ / පැලඳවීමේ )

v) කුඹුරෙහි කෘමි රෝග .................................. පැරැන්නෝ විවිධ කෙම් ක්‍රම යොදා ගත්හ. ( මර්දනයට / මර්ධනයට )

vi) ඔවුහු .................................. ලංකා නාට්‍ය තරගාවලිය සඳහා සුදුසුකම් ලැබූහ. ( සමස්ත / සමස්ථ )

vii) සුධීරගේ විභාග .................................. අසා දෙමව්පියෝ අපමණ සතුටට පත් වූහ. ( ප්‍රතිපල / ප්‍රතිඵල )

viii) උපාසිකාව විහාරයේ ඇති සඳකඩ .................................. අසල බිම හිඳ ගත්තා ය. ( පහණ / පහන )

ix) කාබනික පොහොර යොදා වවන ලද .................................. විකිණීමට තිබේ. ( පළතුරු / පලතුරු )

x) ඉහළ අහසෙහි .................................. කුරුල්ලන් නුඹ දුටුවෙහි ද ? ( සරණ / සරන )

(ලකුණු 10යි.)

(05) පෙළ පොතේ පාඩම්වලින් උපුටා ගත් පහත දැක්වෙන ප්‍රකාශ **කවුරුන් විසින් කා හට** කියන ලද දැ යි ලියන්න.

i) "මාගේ මේ විජිතයට අවසර නැතිව ඇතුල් වූ කා කවුද ?"

ii) "ඒත් මං කැමති විට පමණක් එහි පැමිණෙන්නට ඉඩ දෙන්න."

iii) "කාටවත් මොකවත් වුණොත් දැන ගන්නේ කොහොම ද ?"

iv) "අපි කාටත් විවේකය ඕනැ. ඒකට හොඳ ම වෙලාව තමයි නොහගතේ"

v) "ඇයි ඔය මඩක්කුවෙ උඹල තියාපු හොදිවලින් මං ගත්තෙ" (ලකුණු 02 × 05 = 10යි.)

(06) පහත සඳහන් ඡේද කොටස කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

විශ්වයේ වෙනත් තැනක ජීවයක් ඇත් දැ යි බොහෝ තාරකා විද්‍යාඥයින් දැන් විමසන්නේ නැත. ඒ වෙනුවට ඔවුන්ගේ මනසේ ඇති ප්‍රශ්නය වන්නේ, 'අප එය සොයා ගන්නේ කවදා ද ?' යන්න ය. අප ජීවිත කාලය තුළ - බොහෝ දුරට ඉදිරි වසර කිහිපය තුළ - දුර ඈත ලෝකයක ජීවය පිළිබඳ සලකුණක් සොයා ගැනීමට හැකි වනු ඇතැ යි බොහෝ දෙනෙක් සුබවාදී ව පසු වෙති. නාසාහි 'ජේම්ස් වෙබ් අභ්‍යවකාශ දුරේක්ෂය (JWST)' මෑතක දී අපගේ සෞරග්‍රහ මණ්ඩලයෙන් පිටත ග්‍රහලෝකයක ජීවය පිළිබඳ සිත්ගන්නාසුලු ඉඟි කිහිපයක් අනාවරණය කර ගත්තේ ය. මෙවැනි දුරේක්ෂවලට ඈත තාරකාවල කක්ෂය වටා භ්‍රමණය වන ග්‍රහලෝකවල වායුගෝලය විශ්ලේෂණය කළ හැකි අතර අවම වශයෙන් පෘථිවියේ හමු වන ජීවීන්ට පමණක් නිපදවිය හැකි රසායනික ද්‍රව්‍ය සෙවීමට හැකි ය.

පසුගිය වසරේ සැප්තැම්බර් මස මුල දී එවැනි සොයා ගැනීමක් සිදු විය. පෘථිවියේ සරල සාගර ජීවීන් විසින් නිපදවන වායුවක සංඥාවක් විය හැකි යමක් ආලෝක වර්ෂ 120ක් ඈතින් පිහිටි 'K2-18b' නම් ග්‍රහලෝකයේ වායුගෝලයේ ඇති බවට අනාවරණය විය. එම ග්‍රහලෝකය ඇත්තේ 'ගෝල්ඩිලොක්ස් කලාපය' ලෙස තාරකා විද්‍යාඥයින් විසින් හඳුන්වනු ලබන කලාපයේ ය. 'ගෝල්ඩිලොක්ස් කලාපය' යනු ජීවයට අත්‍යවශ්‍ය වන ද්‍රව ජලය පවතින පරිදි ග්‍රහලෝකයක් එහි පෘෂ්ඨය ඉතා උණුසුම් හෝ අධික ශීතල හෝ නොවන ලෙස මව් තාරකාවේ සිට නිවැරදි දුරකින් පිහිටිය හැකි කලාපය යි. ජීවය පැවතීමට බොහෝ දුරට ඉඩ ඇති තවත් ග්‍රහයකු වන්නේ බ්‍රහස්පති ග්‍රහයාගේ අයිස් සහිත චන්ද්‍රයකු වන 'යුරෝපා' ය. කොටි වයිරම් මෙන් දිස් වන මතුපිටක් ඇති එය, සුන්දර ලෝකයකි. යුරෝපාහි අයිස් සහිත පෘෂ්ඨයට පහළින් සාගරයක් ඇති අතර එයින් ජල වාෂ්ප විශාල වශයෙන් අභ්‍යවකාශය වෙත නිකුත් වේ.

*( BBC NEWS සිංහල - වෙබ් අඩවියෙහි පළ වූ ලිපියක් ඇසුරෙනි. )*

i) මෙම ඡේද කොටසට අනුව බොහෝ දෙනා විසින් බලාපොරොත්තු තබා ගෙන සිටින කරුණ කුමක් ද ?

ii) 'ජේම්ස් වෙබ්' දුරේක්ෂය මගින් 'K2-18b' නම් ග්‍රහලෝකයේ වායුගෝලයෙන් සොයා ගත් දෙය කුමක් ද ?

iii) තාරකා විද්‍යාඥයින් විසින් හඳුන්වනු ලබන 'ගෝල්ඩිලොක්ස් කලාපය' යනු කුමක් ද ?

iv) මෙහි සඳහන් පරිදි 'යුරෝපා' යනු කුමක් ද ?

v) ඉහත ඡේද කොටසින් උපුටා ලියන්න.

(අ) උපමාවක් - .................................... (ආ) මහාප්‍රාණ අකුරක් සහිත වචනයක් - ....................................

(ලකුණු 02 × 05 = 10යි.)

(07) පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) "කුනිස්සන්ට දැල් දානවා වගේ" යන පිරුළෙන් කියැවෙන අදහස කුමක් ද ? (ලකුණු 02යි.)

ii) පහත කවියේ ඉතිරි පද පේළි දෙක සුදුසු පරිදි නිර්මාණය කරන්න. (ලකුණු 02යි.)

"උදා ඉරෙන් මල් පිබිදෙන සොඳුරු උදෑසනේ
රටාවකට ගී ගයනා කුරුලු පොඩිත්තනේ .
..........................................
.......................................... "

iii) "මගේ සුරතලා" යන මාතෘකාව යටතේ පද පේළි 04ක **එක් කවියක්** නිර්මාණය කරන්න. (ලකුණු 04යි.)

"..........................................
..........................................
..........................................
.......................................... "

iv) "අවුරුදු සිහිනය" උපුටා ගෙන ඇති **කෙටි කතා සංග්‍රහයේ නම** සහ **කතුවරයාගේ නම** ලියන්න. (ලකුණු 02යි.)



REGISTRAR
De Mazenod College
Kandana.